122789
II
06/10

300/

# අපර පොළොන්නරු යුගයේ කලා ශිල්ප
## (ක්‍රි: ව: 1186_1236)

ජයසිරි ලංකාගේ. ශාස්ත්‍රවේදී (පුරාවිද්‍යා) ගෞරව.

ශ්‍රී ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයයේ ශාස්ත්‍රපති (පුරාවිද්‍යා)
පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන නිබන්ධයයි.

122789

# හැඳින්වීම

අපර පොළොන්නරු සමයේ කලා ශිල්ප වශයෙන් හඳුන්වා ඇති මෙම නිබන්ධය ක්‍රි:ව: 1186 සිට 1236 දක්වා අර්ධ ශත වර්ෂයක කාල පරිච්ඡේදයට අදාළ වේ. මෙම කාල පරිච්ඡේදය පොළොන්නරු සමයේ අග කොටසට අයත් බැවින් අපර පොළොන්නරු යුගය වශයෙන් හැඳින් වීමි. මේ වෙනස දේශපාලන මෙන්ම ආගමික ක්ෂේත්‍රයේද කැපී පෙනේ. එය කලා ශිල්පයන්ට බලපා ඇත. මේ ග්‍රන්ථයේ පරමාර්ථය එකල කලා ශිල්ප පිළිබඳ විග්‍රහයක් කිරීමයි.

පළමුවෙනි පරිච්ඡේදයේ අපර පොළොන්නරු සමයේ ඉතිහාසය පිළිබඳව සැකෙවින් දක්වා ඇත. ඉතිහාසය හදාරන්නන් විසින් මේ යුගයේ දේශපාලන ඉතිහාසය පිළිබඳව 1 පරාක්‍රමබාහුගෙන් පසු කාලය ගැන වැඩි සැලකිල්ලක් දක්වා නැත. එංග කථාවන්හිද ඇතැම් කරුණු ඇතුළත්ව නැත. එකල දේශපාලන තත්ත්වය වඩා පැහැදිලි කර ගැනීමට මෙම පරිච්ඡේදයෙන් උත්සාහ කෙළෙමි. නිශ්ශංකමල්ල බලයට පත්වීමට තුඩු දුන් කරුණු ද, ඔහුගෙන් පසු අවුල් ඇතිවීමට හේතුවද රජකමට තරඟ කළ අයගේ අයිතිවාසිකම් පැහැදිලි කරගැනීමට කරුණු රාශියක් ඉදිරිපත් කෙළෙමි. කලා ශිල්ප ආගම හා සම්බන්ධ නිසා මෙහිදී ආගමික තත්ත්වය පිළිබඳ කරුණු ඇතුළත් කර තිබේ.

මේ යුගයේ ඉතිහාසය ද කලා ශිල්පද විස්තර කිරීමේදී වැඩි වශයෙන් උපයෝගී කර ගත්තෙ' ශිලා ලේඛන යි. එමනිසා දෙවන පරිච්ඡේදයෙහි එකල අයත් ශිලා ලේඛන පිළිබඳ විස්තරයක් ඇතුළත් කෙළෙමි. එම විස්තරයේදී දේශපාලන තත්ත්වය රාජත්වය දේශපාලන සංකල්පය, යනාදී කරුණු ඇසත් එළිදරව් කර තිබේ. නිශ්ශංකමල්ල කාලිංග වංශිකයෙකු වූ නිසා වැසියාගේ හොඳ හිත දිනා ගැනීමට කටයුතු කළේයයි දක්වා ඇති අදහස ප්‍රතික්ෂා විරහිත බව තහවුරු කිරීමට වෑයම් කෙළෙමි. මෙහිදී දේශපාලන, ආගමික අධිකරණ, හා ආර්ථික කටයුතු පිළිබඳ සෙල්ලිපි වලින් ලැබෙන සාක්ෂ්‍ය මත පිහිටා කරුණු විග්‍රහ කිරීමට වෑයම් කෙළෙමි.

තෙවන පරිච්ඡේදය සහ නිර්මාණ ශිල්පයේ ආගමික අංගය පිළිබඳවයි. අනුරාධපුර යුගයේ පැවති නිර්මාණ ක්‍රම හා මූල ධර්ම ආරක්ෂා කරමින් ගොඩනැඟිලි නැඟූ වද පොළොන්නරු යුගයේදී අළුත් නිර්මාණ ක්‍රම හා ද්‍රව්‍ය උපයෝගී කරගෙන තිබේ. පොළුවේ අපර පොළොන්නරු යුගයටද එය බල පෑවේය. අපර පොළොන්නරු යුගයේද අළුත් ක්‍රමයේ සංඝාරාම තැනීම ආරම්භ වූයේ යයි සිතේ. රුවන්වැලි සෑය වටා සිංහල මල්ල තැනුවේ යයි කියන සංඝාරාමය එබඳු එකකි. පිළිම ගෙවලද එක පෙළට පිළිම තුනක් තැන්පත් කිරීම මෙකල රහප්‍රිය විය. වටදා ගෙය පරිසමාප්ත තත්ත්වයට පත්වූයේ අපර පොළොන්නරු සමයේදීය. පොළොන්නරු සමයේ තනන ලද දළදා මන්දිර ක්‍රමය අපර පොළොන්නරු සමයේදී තවදුරටත් සකස් වී තිබේ. පොත් ගුල් වෙහෙර ආරාමය කාම්බෝජ ආභාසය ඇතිව තනන ලද්දකැයි තීරණය කළ හැකිය. අපර පොළොන්නරු සමයේදී ආගමික වස්තු තැනීම ද රහප්‍රිය විය. එකලට අයත් දැනට ශේෂව ඇති වස්තූන් සැම එකක්ම ගැන මෙහි විස්තර කර ඇත. ලෞකික ගොඩනැඟිලි ගැන විස්තර කිරීමට සතර වෙනි පරිච්ඡේදය වෙන් කැරිණ. සිංහල මල්ල පොළොන්නරුවේ තවත් මාළිගයක් තැනුවේය. එයට අවශ්‍ය රාජ සභාවක්ද ඒ අසලින්ම තැනුවේය. මේ ගොඩනැඟිලි හා I පරාක්‍රමබාහු විසින් කරවූ ගොඩනැඟිලිවලත් උයන් පොකුණු, සහ ඒවා හා සංසන්දනය කිරීමට උත්සාහයක් දරා ඇත.

පස්වැනි පරිච්ඡේදය අපර පොළොන්නරු යුගයේදී පාදම්, දොරටු, බිත්ති, වැහි වාහල්කඩ කැටයම් හා වට පිළිම ගැන විමසුමක් කරයි. මෙහිදී ඒවා සඳහා යොදාගත් ද්‍රව්‍යත්, ඒවායේ දැකිය හැකි විවිධ ශෛලීන් ගැනත් කරුණු දැක්වීමට උත්සාහ ගන්නෙමි. අපර පොළොන්නරු යුගයට අයත් මෙතෙක් ප්‍රසිද්ධ කළ හා නොකළ ශිලාලේඛන I වැනි උප ග්‍රන්ථය වශයෙන් මෙහි යොදා තිබේ. II උප ග්‍රන්ථය එම යුගයට අයත් රජ පරපුර දක්වන සටහන්වලින් සමන්විතය.

මෙහි ඇතුළත් කළ සියළුම නිරූපණ හා චිත්‍ර පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන වලින් උපුටා ගත් ඒවා බව කෘතඥතා පූර්වකව සඳහන් කරමි.

ජයසිරිලංකාගේ.

# ප ටු න


| | |
|---|---|
| හැඳින්වීම | 11-111 |
| නිරූපණ නාමාවලිය | 1v- |
| ඡායාරූප නාමාවලිය | vi |
| සංකේත සූචිය | v11- 1x |
| පරිච්ඡේද | |
| 1. ඓතිහාසික පසුබිම | 1-23 |
| 2. ශිලාලේඛන | 24-60 |
| 3. ගෘහ නිර්මාණ ශිල්පය / ආගමික | 61-83 |
| 4. ගෘහ නිර්මාණ ශිල්පය/ලෞකික | 84-93 |
| 5. කැටයම් ශිල්පය | 94-115 |
| 6. සමාප්තිය | 116-120 |
| උප ග්‍රන්ථ | |
| නිරූපණ | |
| ඡායාරූප | |